# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2078/8 - 2018 ජූලි මස 02 වැනි සඳුදා - 2018.07.02

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී )


# IV (අ) වැනි කොටස - පළාත් සභා

## ආණ්ඩුකාරවරුන් විසින් කරන ලද පත්කිරීම් ආදිය

මගේ අංකය :-01/10/03/04.

### ඌව පළාතේ පළාත් සභාව

ඌව පළාත් ආණ්ඩුකාරවරයා විසින් කරනු ලබන පත්කිරීම්

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 1987 අංක 42 දරන පළාත් සභා පනතේ 32(1) වැනි වගන්තිය යටතේ, ගරු ඌව පළාත් ආණ්ඩුකාරතුමා විසින් පහත සඳහන් පත්කිරීම් සිදු කරන ලද බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

01. ප්‍රජා සෞඛ්‍ය විශේෂඥ වෛද්‍ය නිමල් ශාන්ත ගමගෙදර මහතා, 2017.04.24 දින සිට ක්‍රියාත්මක වන පරිදි තම නිත්‍ය තනතුරේ රාජකාරිවලට අතිරේකව, ඌව පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ තනතුරේ වැඩ බැලීමට,

02. ඌව පළාත් පාලන කොමසාරිස් එම්. එම්. විජේනායක මහතා 2017.12.10 වන දින සිට 2017.12.13 දින දක්වා විදේශගත වන බැවින්, 2017.12.10 දින සිට ඔහු නැවත දිවයිනට පැමිණෙන තෙක්, ශ්‍රී ලංකා පරිපාලන සේවයේ III වන පන්තියේ නිලධාරී ටී. ගජේන්ද්‍රන් කුමාර් මහතා තම නිත්‍ය තනතුරේ රාජකාරිවලට අතිරේකව, ඌව පළාත්, පළාත් පාලන කොමසාරිස් තනතුරේ රාජකාරි ආවරණය කිරීමට

03. ශ්‍රී ලංකා පරිපාලන සේවයේ I පන්තියේ නිලධාරී ජී. කේ. එස්. එල්. රාජදාස මහතා, 2018.01.24 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි ඌව පළාත් මාර්ග සංවර්ධන, නිවාස, ජල සම්පාදන, වතු යටිතල පහසුකම්, සමුපකාර සහ ද්‍රවිඩ අධ්‍යාපන (මුස්ලිම් පාසල් හැර) අමාත්‍යාංශයේ ලේකම් වශයෙන්,

04. ශ්‍රී ලංකා සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සේවයේ I වන පන්තියේ නිලධාරී එස්. එම්. ගමගේ මහතා, 2018.03.09 වන දින සිට, ඌව පළාත් සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ අතිරේක අධ්‍යක්ෂ වශයෙන්,

05. ශ්‍රී ලංකා කෘෂිකර්ම සේවයේ II වන පංතියේ නිලධාරිණී ඒ. එම්. ඩී. අතපත්තු මහත්මිය 2018.03.09 වන දින සිට බදුල්ල නියෝජ්‍ය කෘෂිකර්ම අධ්‍යක්ෂ වශයෙන්,


1A - PG 4098 — 57 (2018/07)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

06. ශ්‍රී ලංකා කෘෂිකර්ම සේවයේ II වන පංතියේ නිලධාරිණී ඒ. එම්. ඩී. අතපත්තු මහත්මිය තම නිත්‍ය තනතුරේ රාජකාරිවලට අතිරේකව 2018.03.28 වන දින සිට, ඌව පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ පළාත් කෘෂිකර්ම අධ්‍යක්ෂ තනතුරේ වැඩ බැලීමට,

07. ශ්‍රී ලංකා පරිපාලන සේවයේ III වන පංතියේ නිලධාරි බී. එම්. කේ. ජී. බණ්ඩාර මහතා, වහාම ක්‍රියාත්මක වන පරිදි (2018.05.14 දින සිට) බණ්ඩාරවෙල මහ නගර සභාවේ නාගරික කොමසාරිස් වශයෙන්,

1

එච්. එම්. සෝමතිලක,
ඌව පළාත් ආණ්ඩුකාරවර ලේකම්.

2018 ජූනි මස 05 වැනි දින,
බදුල්ල ආණ්ඩුකාරවර කාර්යාලයේ දී ය.

07 - 499

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.